

# 10 –පාඩම

# සැබෑ ළෙන්ගතුකම

## ක්‍රියාකාරකම 1

★ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න .

1. මිනිසුන් සතුන් ආදීන් මෙන් ම කල්පිත සත්ව චරිත යොදා ගනිමින් ගෙතූ කතා ……………………. ගණයට අයත්වේ .

   i නිර්මාණාත්මක ප්‍රබන්ධ ii නවකතා ප්‍රබන්ධ iii කෙටිකතා ප්‍රබන්ධ iv සාහිත්‍ය ප්‍රබන්ධ

2. " සැබෑ ළෙන්ගතුකම " පාඩම සකසා ඇත්තේ ……………………. කෘතිය ඇසුරෙනි .

   i පුංචි දිය කිඳුරිය ii හිම රැජින iii නයිටිංගේල් iv අවලස්සන තාරාවා

3. හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන්ගේ කෘතියක් **නොවන්නේ**

   i අවලස්සන තාරාවා ii හිම රැජින iii පුංචි දිය කිඳුරිය iv සුදෝසුදු

4. " සැබෑ ළෙන්ගතුකම " පාඩමෙන් කියවෙන්නේ …………………….. …. පිළිබඳ තොරතුරු ය .

   i දඟකාර දරුවෙකු ii සිංදු කියන පුංචි කිරිල්ලියක iii දරුණු අධිරාජ්‍යයෙකු iv සුරතල් සතෙකු

5. හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් …………………………. ජාතිකයෙකි .

   i ජර්මන් ii ඩෙන්මාර්ක් iii ඉතාලි iv රුසියානු






# ක්‍රියාකාරකම 2

★ පහත සඳහන් පාඨයන් කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවේ (අවස්ථා සම්බන්ධය) ප්‍රකාශ කරන ලද දැයි ලියන්න.

| අනු අංකය | ප්‍රකාශය | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|---|
| 1 | " ඔබ හැමදාම මා අසල ම ඉන්න " | | | |
| 2 | " මම දන්නවා ලස්සන සිංදු කියන ඒ කිරිල්ලිය ඉන්න තැන " | | | |
| 3 | " මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වන පෙත තුළයි " | | | |
| 4 | "නෑ නෑ එහෙම වෙන්න බෑ . මෙය ජපානයේ අධිරාජයා එව්ව පොතක් " | | | |
| 5 | "අනික පොත්පත්වල තියෙන හැම දෙයක් ම ඇත්ත විය නොහැකියි ." | | | |
| 6 | " නෑ නෑ එසේ කරන්න එපා , ඇය පුළුවන් තරම් කාලයක් ඇගේ මෙහෙය ඉටු කළා " | | | |






The true Nightingale sings to the Emperor

# ක්‍රියාකාරකම 3

★ “අ ”කොටසේ සඳහන් යෙදුමේ අදහස “ආ” කොටසෙන් තෝරා යා කරන්න .

| අ | ආ |
|---|---|
| 1. තේජෝ බල පරාක්‍රමයෙන් | වන උයනක් |
| 2. පිට මං කළා | බලවත් ලෙස සතුටට පත්වීම |
| 3 . ප්‍රත්‍යුපකාර | රැව් පිළිරැව් |
| 4 . සන්තුෂ්ටිය | කෝපය |
| 5 . අමන්දානන්දයට | මරණයට ළඟා වූ |
| 6 . අත්‍යුත්කර්ෂවත් | නෙරපා හැරියා |
| 7 . වනෝද්‍යානයක් | සතුට |
| 8 . රාව ප්‍රතිරාව | බොහෝ උසස් ලෙස |
| 9 . උදහස | තේජසින් බලයෙන් හා එඩිතර බවින් යුත් |
| 10. මරණාසන්න | පෙරළා සිදු කරන උපකාරය |

# ක්‍රියාකාරකම 4

★ පහත දැක්වෙන විස්තරයට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න .

1 . කිසියම් ජාතියක් වර්ගයක් කියවෙන නාම -……………………………………

2 . ක්‍රියා මූලයකට ප්‍රත්‍යයක් එකතුවීමෙන් සෑදෙන නාම -………………………

3 . යම් ද්‍රව්‍යයක් දැක්වෙන නාම -…………………………………………………..

4 . නාම මූලයකට ප්‍රත්‍යයක් එකතුවීමෙන් සෑදෙන නාම -…………………………

5 . පුද්ගලයන් හා ද්‍රව්‍ය පිළිබඳ ගුණයක් හෝ ස්වභාවයක් දක්වන නාම -……….

6 . නාමයකින් ක්‍රියා අර්ථයක් හැඟවෙන නාම -……………………………………

7 . කිසියම් කෙනෙකු , ස්ථානයක් හො ද්‍රව්‍යයක් විශේෂයෙන් හඳුන්වන නාම -………

8 . නාම පද දෙකක් හෝ කිහිපයක් එකතව සකස් කරන නාම පද - ………………………………….

9. නාම පදයක් වෙනුවට යොදන නාම …………………………………………

10 . පණ ඇති පිරිස හඳුන්වනු ලබන නාම - ………………………………………

(සචේතනික නාම    තද්ධිත නාම    ගුණ නාම    සමාස නාම
සර්ව නාම    සංඥා නාම    කෘදන්ත නාම
ජාති නාම    ක්‍රියා නාම    ද්‍රව්‍ය නාම )

# ක්‍රියාකාරකම 5

නාම පද පහත සඳහන් වගුවට නිවැරදිව ඇතුළත් කරන්න .

| | | | | |
|---|---|---|---|---|
| සුරතල් | ලෙව්වමි | ඉසුරුමත් | මිනිසා | ලිවීම |
| මුවා | බල්ලෝ | ගස්වැල් | ගම්පෙරළිය | සුදෝසුදු |
| මිහිරි | වඳුරා | වළස්සු | රූමත් | දුවන්නා |
| පැන්සල් | ඔරු | ධනවත් | මේවා | කොමළ |
| කියවන්නෝ | ගුරුදෙගුරු | තොපි | ඇඳුම් | ලෝහමය |
| දක්ෂ | මම | සීතාදේවි | ඉරහඳ | ප්‍රිය |
| විදේශික | ඒකා | සියපත් | ගයන්නී | කොළඹ |
| දත් | නුඹ | සලකන | මල් | පොත්පත් |

| අ අ | ජාති නාම | ද්‍රව්‍ය නාම | ගුණ නාම | සංඥා නාම | තද්ධිත නාම | කෘදන්ත නාම (ක්‍රියා නාම ) | සර්ව නාම | සමාස නාම |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |
| 4 | | | | | | | | |
| 5 | | | | | | | | |

❖ ක්‍රියාකාරකම 6

**පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න**

1. ජාති නාම ගණයට අයත්වන සෑම නාම පදයක් ම ප්‍රාණවාචී පද වේ .

2 . “උගන්වන්නී” යනු ක්‍රියා නාමයක් වේ .

3 . පණ නැති දේ හැඳින්වීමට පමණක් සර්ව නාම පද යොදා ගැනේ .

4. අචේතනික හෙවත් අප්‍රාණවාචී පද ද්‍රව්‍යය නාම ගණයට අයත් වේ .

5. නාම පද දෙකක් හෝ කිහිපයක් එක් වීමෙන් සමාස නාම සෑදේ .

6. ගුණ නාම යෙදෙන්නේ නාම පදයකට මුලින් ය .

7 . ක්‍රියා නාම , කෘදන්ත නාම යනුවෙන් ද හැඳින්වේ .

8 . ප්‍රාණවාචී නාම පද පමණක් සර්ව නාම ගණයට අයත් වේ .

9. ඇය , ඔවුහු යන පද සර්ව නාම පද වේ .

10 . පුද්ගලයන් , සතුන් ප්‍රාණවාචී නාම පද ගණයට අයත් වේ .

| |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |

❖ ක්‍රියාකාරකම 7

පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨවල ඉරි ඇඳි පද අයත් නාම වර්ගය තෝරා ලියන්න .

1 . **මල්** ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා .

2 . **විසුළු** මුහුණ දකිමින් එම සඳේයා

3 . පළමුව **දුවන්නා** තරගයෙන් ජය ගනු ඇත .

4 . **මහනුවර** දළදා පෙරහැර ඉතා වර්ණවත් ය .

5 . **මම** පොඩි මාමා සමඟ සත්තු වත්ත නැරඹීමට ගියෙමි .

6 . කුරුණෑරිස් මුදලාලි **ධනවත්** තැනැත්තෙකි .

7 . මෙබඳු **මිහිරි** කවියක් මා කිසිදා අසා නැත .

8 . ඇය **අහසපොළොව** ගැටලන්නට මෙන් කල්පනා කරන්නට විය .

9 . පොත් **කියවන්නෝ** බොහෝ දැනුම ලබති .

10 . කැලණි ගඟේ **ඔරු** යනවා බලා වරෙන් .

සර්ව නාම කෘදන්ත නාම සමාස නම ගුණ නාම
තද්ධිත නම ද්‍රව්‍ය නාම සංඥානාම ද්‍රව්‍ය නාම ගුණ නාම
කෘදන්ත නාම

# ප්‍රායෝගික අභ්‍යාස

**පහත සඳහන් සැකිල්ලට අනුව ලස්සන කතාවක් නිර්මාණය කරන්න .**

එය අලුත් අවුරුදු නිවාඩු සමයයි .දිනක් සවස හිටිහැටියේ ම ලොකු මාමා ඔහුගේ වෑන් රථයෙන් අප නිවසට පැමිණ තාත්තා සමග කතා කරමින් සිට පැයකින් පමණ ආපසු ගියේ ය. ඔහු ආපසු ගොස් ටික වේලාවකින් තාත්තා මාත් නංගිත් කැඳවා හෙට උදෑසනින් ම මාමලාගේ වෑන් රථයෙන් යාපනය නැරඹීම සඳහා යෑමට සූදානම් වන ලෙස කීවේ ය . පසුව දා උදෑසනින් ම අවදි වීමේ බලාපොරොත්තුවෙන් එදින රාත්‍රියේ මම නින්දට ගියෙමි .

# පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1. නිර්මාණාත්මක ප්‍රබන්ධ
2 . නයිටිංගේල්
3. සුදෝසුදු
4 . සිංදු කියන පුංචි කිරිල්ලියක්
5 . ඩෙන්මාර්ක්

## ක්‍රියාකාරකම 2

| | කවුරුන් විසින් | කා හට | අවස්ථාව |
|---|---|---|---|
| 1 | අධිරාජයයා | නයිටිංගේල් කිරිල්ලියට | අධිරාජයයා සුවපත් කිරීමට ගීත ගායනා කළ අවස්ථාවේ |
| 2 | මෙහෙකාර දැරිය | යුව රජු ඇතුළු පිරිසට | සිංදු කියන අරුම පුදුම කිරිල්ලිය සොයන අවස්ථාවේ |
| 3 | නයිටිංගේල් කිරිල්ලිය | මෙහෙකාර දැරිය ,<br>යුව රජු ඇතුළු පිරිසට | සිංදු කියන අරුම පුදුම කිරිල්ලිය සොයා ගත් අවස්ථාවේ |
| 4 | අධිරාජයයා | යුව රජු ඇතුළු පිරිසට | සිංදු කියන අරුම පුදුම කිරිල්ලිය සොයා ගෙන එන ලෙස අණ කළ සිටි අවස්ථාවේ . |
| 5 | යුව රජු ඇතුළු පිරිස | අධිරාජයයාට | සිංදු කියන අරුම පුදුම කිරිල්ලිය සොයා ගෙන එන ලෙස අණ කළ අවස්ථාවේ . |
| 6 | නයිටිංගේල් කිරිල්ලිය | අධිරාජයයාට | කෘත්‍රිම නයිටිංගේල් කිරිල්ලිය විනාශ කරන බව පැවසූ අවස්ථාව . |

## ❖ ක්‍රියාකාරකම 3

1 . තේජෝ බල පරාක්‍රමයෙන් - තේජසින් බලයෙන් හා එඩිතර බවින් යුත්
2 . පිට මං කළා - නෙරපා හැරියා
3 . ප්‍රත්‍යුපකාර - පෙරළා සිදු කරන උපකාරය
4 . සන්තුෂ්ටිය - සතුට
5 . අමන්දානන්දයට - බලවත් ලෙස සතුටට පත්වීම
6 . අත්‍යුත්කර්ෂවත් - බොහෝ උසස් ලෙස
7 . වනෝද්‍යානයක් - වන උයනක්
8 . රාව ප්‍රතිරාව -රැව් පිළිරැව්
9 . උදහස - කෝපය
10. මරණාසන්න - මරණයට ලං වූ

## ක්‍රියාකාරකම 4

1 . ජාති නාම
2 . කෘදන්ත නාම
3 . ද්‍රව්‍ය නාම
4 . තද්ධිත නාම
5 . ගුණ නාම
6 . ක්‍රියා නාම
7 . සංඥා නාම
8 . සමාස නාම
9 . සර්ව නාම
10 . සචේතනික නාම

## ක්‍රියාකාරකම 5

| අ අ | ජාති නාම | ද්‍රව්‍ය නාම | ගුණ නාම | සංඥා නාම | තද්ධිත නාම | කෘදන්ත නාම ක්‍රියා නාම | සර්ව නාම | සමාස නාම |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මුවා | පැන්සල් | සුරතල් | ලෙච්චමී | විදේශික | කියවන්නෝ | ඒකා | පොත්පත් |
| 2 | බල්ලෝ | ඔරු | මිහිරි | ගම්පෙරළිය | ඉසුරුමත් | ගයන්නී | නුඹ | ගුරුදෙගුරු |
| 3 | වඳුරා | දත් | කොමළ | සීතාදේවි | ධනවත් | ලිවීම | තොපි | ගස්වැල් |
| 4 | වළස්සු | ඇඳුම් | ප්‍රිය | සුදෝසුදු | රූමත් | දුවන්නා | මම | සියපත් |
| 5 | මිනිසා | මල් | දක්ෂ | කොළඹ | ලෝහමය | සලකන | මේවා | ඉරහඳ |

## ක්‍රියාකාරකම 6

**1. X** **2. √**

**3 . X** **4 . √**

**5 . √** **6 . X**

**7 . √** **8 . X**

**9 . √** **10 . √**

## ක්‍රියාකාරකම 7

1 . ද්‍රව්‍ය නාම

2 ගුණ නාම

3 . කෘදන්ත නාම

4 . සංඥා නාම

5 . සර්ව නාම

6 . තද්ධිත නම

7. ගුණ නාම

8 . සමාස නම

9 . කෘදන්ත නාම

10 . ද්‍රව්‍ය නාම